# උත්සහවන්ත මලී...



ඩබ්.එම්. සෙනුකි ගිහංසා වීරවංශ

# උත්සහවන්ත මලී

W.M.සෙනුකි ගිහංසා වීරවංශ

කෘතියේ නම : උත්සහවන්ත මලී

ISBN අංකය : 978624208359-9

කතෘගේ නම : W.M.සෙනුකි ගිහංසා වීරවංශ

කතෘගේ වෙනත් කෘති : අපූරු යාළුකම, අකීකරු දරුවන්

පාසල : මහනුවර මහාමායා බාලිකා විදුහල

ඉගෙනුම ලබන පන්තිය : 4-E

කෘතිය පළ කරන දිනය : 2026.05.10

මුද්‍රණය : ' The PRESS'
කොටුගොඩැල්ල වීදිය,
මහනුවර

# පිදුම

මාගේ ආදරණීය මහාමායා මෑණියන්ට

මගේ මේ පොත

ආදරයෙන් පුදමි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදනමෙ කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ  දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වු පාසල් දරුවන් මඟපෙන්වු ගුරුහවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමයා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වු ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයෙන් එක් කිරීමට ලැබීම මා ලැබු භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මුලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ වයාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවු විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වු සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ අභිර්වාදය පිරිනමමි. මෙම ව්‍යපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ඨ සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත්.බී.එස්.අභයකෝන්.
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත,
සම්මානනිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දු දරුවන් ග්‍රන්ථකරණය යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය,ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කාර ක්‍රියාවට නැංවීමට කැපවු සියලු දෙනාගේ විශිෂ්ට වු උතුම් ප්‍රයත්තය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වු සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශිලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධන වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණය වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණය ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එක ගමක මලී කියලා පුංචි ගැහැනු ළමයෙක් හිටියා. මලීට පුංචි පවුලක් හිටියා. ඒ අම්මයි, තාත්තයි, අයියයි, අක්කයි මලී ඉන්නේ 5 වසරේ. අක්කයි අයියයි හොඳට ඉගෙන ගන්නවා.



මලීත් ආසයි ඉගෙන ගන්න. හැබැයි මලී ආසයි සිංදු කියන්න නටන්න. මලී උදෙන්ම ඇහැරිලා පාසල් යන්න සූදානම් වුණා. මලීගේ අක්කා ටිකක් සැරයි. "නංගි ඉක්මනට ලෑස්ති වෙන්නකෝ. ඔයා හෙමින් හෙමින් ලෑස්ති වෙන්නේ. හැබැයි මම දාලා යනවා." අක්කා කෑගැසුවා.



මලී දුකින් ලැස්ති වුණා. මලී පන්තියේ දී වැඩ කරන්නේ හෙමින් හෙමින් ළමයි මලීට විහිළු කරා. මලීට ගොඩක් දුක හිතුණා.



මලී පැත්තකට වෙලා හිටියා. ඉස්කෝලේ ඉවර වෙලා ඇඳුම් මාරු කරලා වත්ත පහළට ගියා. එතන තිබෙන ගලක් ගාව ඉඳගෙන කල්පනා කළා. ගල දිගේ හෙමින් හෙමින් ගොළුබෙල්ලෙක් ආවා. මලීගෙන් ඇහුවා.



"මොකද යාළුවේ දුකෙන් ඉන්නේ" කියලා ගොළුබෙලි පැංචා ඇහුවා. "මට යාළුවෝ විහිළු කරනවා" කියලා මලී කිවුවා. "ඒවා ගණන් ගන්න එපා. ඔයා උදෙන්ම නැගිටලා ඔයාගේ වැඩ ටික කරගන්න. මමත් හෙමින් වැඩ කරන්නේ."



මටත් යාළුවෝ විහිළු කළා. ඔයා ඉස්කෝලේ ගිහිල්ලා හොඳට ඇහුන්කන් දීලා හොඳට වැඩ කරන්න. ගොළුබෙලි පැංචා කිවුවා.




අද ඉඳන් හොඳට වැඩ කරන්නම්. කලින් නැගිටින්නම්. ඔයාට ස්තූතියි යාළුවේ. මලී සතුටින් ගෙදර ගියා.



මලී කල්පනා කළා. අද ඉඳන් හොඳට වැඩ කරලා හොඳ ළමයෙක් වෙලා කඩිසර වෙනවා කියලා මලී හිතාගත්තා. උදෙන්ම ඇහැරිලා අක්කා



එක්ක පාසල් ගියා. පාසලේ දී ටිකෙන් ටික වැඩ කරගත්තා. ටික කාලයක් ගත වුණා. දිනපතා ඉස්කෝලේ ගිහින් ගෙදර ඇවිත් හැමදාම වත්ත පහළ ගොළුබෙලි යාළුවා මුනගැසුනා. ඒ විදිහට ටික කාලයක් ගත වුණා. එයාගේ



ඉස්කෝලේ වැඩ උනන්දුවෙන් කර ගන්නවා. මලී ඉස්කෝලේ කඩිසර හොඳ ළමයෙක් වගේම පන්තියේ පළවෙනියා වුණා. ගුරුවරුන්ටත් සතුටු වුණා. මලී ඉස්කෝලේ



ඉවර වෙලා ගෙදරට දුවන් ආවා. මලී අම්මට විස්තරේ කිව්වා. "ආ ඇත්තද දුව මට බොහොම සතුටුයි." මලීගේ අම්මා කිව්වා. "ඔයා ගොඩක් හොඳ දරුවෙක්." මලීගේ අම්මා කිව්වා.



මලී වත්ත පහළට දුවන් ගිහින් ගොළුබෙලි යාළුවාට කතා කළා. "යාළුවේ අද මට ගොඩක් සතුටුයි. මම පන්තියේ පළවෙනියා." ආ" ඇත්තද "යාළුවේ ඔයා උනන්දුවෙන් වැඩ කළා. මට හරිම සතුටුයි. ගොළුබෙලි යාළුවා කිව්වා. මලී සතුටින් ගෙදර ගියා.





මලී හැමදාම උදෙන්ම අවදි කඩිසරව පාසල් යනවා. ඉතින් පුංචි යාළුවේ මලී වගේ කඩිසර වෙලා උනන්දුවෙන් ඉගෙන ගෙන හැමෝම ආදරේ කරන හොඳ ළමයෙක් වෙන්න.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කරුවන් දැයට දායාද කල මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනිමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් ''හේමමාලා උපහාර '' ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලුම දෙනාටද, දියවඩන නිළමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)